# අතුරලිය ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 29 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට අතුරලිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ එකී ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව්කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2005 දෙසැම්බර් 01 දිනැති අංක 1421/26 දරන ශ්‍රී ලංකා ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව අතුරලිය ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කර තිබුණ අතර, අකුරැස්ස ප්‍රාදේශීය සභාව මගින් අතුරලිය ප්‍රාදේශීය සභාවට වත්කම් හා වගකීම් පැවරීමේදී අකුරැස්ස ප්‍රාදේශීය සභාවට ගෙවීමට ඇති ණයක් ලෙස සටහන් කර ඇති රු.675,576 ක මුදල නිරවුල් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ගබඩා භාණ්ඩ හා ද්‍රව්‍ය ලැබීම්, නිකුත් කිරීම් සඳහා නියමිත ආකෘති පත්‍ර භාවිතා කර වියදම් විශ්ලේෂණයක් මගින් අදාල වැය ශීර්ෂවලට හර කිරීමක් සිදුව නොතිබූ අතර, ලෙජරයේ ආරම්භක තොගයට ගැනුම් එකතු කර අවසන් තොග ගැලපුම් කිරීමෙන් පසු ලද වෙනස ආදායම් හා වියදම් ගිණුමේ රු.1,522,366 ක වියදම් ලෙසට සටහන් කර තිබුණි.

1.3.4 නොසැසඳූ පාලන ගිණුම

මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 04 කට අදාල ශේෂයන්ගේ එකතුව රු.972,440 ක් වූ අතර උපයෝගී ලේඛන/උපලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.979,136 ක් වූයෙන් වෙනස රු.6,696 ක් විය.

1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.1,431,812 ක් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.1,771,141 ක් විය.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

සභාව සතු රු.19,743,047 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා නොතිබුණි.

1.3.7 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| රීති 218 | ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කිරීමට සභාපතිවරයා විසින් කටයුතු කළයුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි.2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිසනක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.167,516 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,428,210 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත | තථ්‍ය | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 1,044 | 1,195 | 541 |
| කුලී | 1,997 | 2,100 | 117 |
| වෙනත් ආදායම් | 14,732 | 13,608 | 16,520 |

2.2.2 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බදු බිල්කිරීම් රු.693,357 ක් වූ අතර 2013 ජනවාරි 01 දිනට හිඟ ශේෂය රු.405,550 ක් විය. ප්‍රවර්තන වර්ෂයේ බිල්කිරීම් වලින් වර්ෂය තුල එකතු කරන ලද මුදල රු.390,070 ක් වූ අතර අයවීමේ ප්‍රගතිය සියයට 56 ක් විය. 2013 ජනවාරි 01 දිනට හිඟ මුදලින් මේ වර්ෂය තුල ලද මුදල රු.184,904 ක් වූ අතර අයවීමේ ප්‍රගතිය සියයට 45 ක් විය.

2.2.3 අක්කර බදු

සමාලෝචිත වර්ෂය සඳහා අක්කර බදු බිල්කිරීම් රු.13,255 ක් විය. 2013 ජනවාරි 01 දිනට හිඟ ශේෂය රු.31,886 ක් විය. 2013 වර්ෂයේ බිල්කිරීම් වලින් වර්ෂය තුල ලැබුණ මුදල රු.6,864 ක් වූ අතර අයවීමේ ප්‍රගතිය සියයට 51 ක් විය. 2013 ජනවාරි 01 දිනට හිඟ මුදලින් මේ වර්ෂය තුල ලද මුදල රු.1,723 ක් වූ අතර අයවීමේ ප්‍රගතිය සියයට 5 ක් තරම් සුළු අගයක් ගෙන තිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු වටිනාකම රු.2,318,289 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) 2005 මාර්තු 31 දිනැති 08/2005 දරන රාජ්‍ය පරිපාලන ලේකම්ගේ චක්‍රලේඛයේ 11.5 වගන්තිය අනුව දේපළ ණය සඳහා බැංකු පොලී අනුපාතය හා නිලධාරියාගෙන් අයකරන සියයට 4.2 ක පොලී අනුපාතය අතර වෙනස රජය විසින් ප්‍රතිපූර්ණය කළ යුතුය. එසේ වුවද 2013 දෙසැම්බර් 31 දිනට එලෙස ප්‍රතිපූර්ණය නොවූ මුදල රු.208,716 ක් විය.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය පරිදි සභා බල ප්‍රදේශයේ සභාවට අයත් මාර්ග ගැසට් පත්‍රයේ පල කරවා ප්‍රසිද්ධ කළ යුතු වුවද 2007 වර්ෂයෙන් පසුව සභාව විසින් ඉදිකරන ලද මංමාවත් සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි. සභා බල ප්‍රදේශයේ මංමාවත් සම්බන්ධයෙන් එක් එක් මාර්ගයේ දිග, පළල, ආරම්භක ස්ථානය හා අවසන් වන ස්ථානය, තාර, කොන්ක්‍රීට්, බොරළු යනාදී ලෙසට මාර්ගයේ ස්වභාවය, වීථි රේඛා යනාදී තොරතුරු ඇතුළත් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

වීථි පහන් නඩත්තුව

(අ) සභා බල ප්‍රදේශය සඳහා අනුමත වීථි පහන් සංඛ්‍යාව 57 ක් වුවද, වීථි පහන් නාම ලේඛනය අනුව බල ප්‍රදේශයේ වීථි පහන් 388 ක් නඩත්තු කර තිබුණි.

(ආ) විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 හා අංක පීඊ/01/01 චක්‍රලේඛයේ 1.4 ඡේදය අනුව සභා බල ප්‍රදේශයේ වීථි පහන් නඩත්තු කිරිමේ කටයුතු සිදුව නොතිබුණු අතර පහන් සවිකිරීමේදී වීථි පහන් වල විදුලි බල පාරිභෝජනය අදාල ප්‍රදේශයේ ගෘහස්ත හා පොදු කාර්ය සිල්ලර පරිභෝජනයෙන් සියයට 3 ට සීමාවිය යුතු වුවද සභාව ඒ පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

2013 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 01 | 01 | | |
| තෘතියික | 02 | 01 | 01 | |
| ද්විතියික | 17 | 16 | 01 | |
| ප්‍රාථමික | 20 | 21 | | 01 |
| වෙනත් (අනියම්,තාවකාලික, කොන්ත්‍රාත්) | - | 03 | | 03 |
| | 40 | 42 | 02 | 04 |

සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් සඳහා රු.9,037,900 ක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂය තුල කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා සඳහා රු.11,227,080 ක මුදලක් වැයකර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලට රු.2,189,180 ක අතිරේක වැයබරක් ඇති වී තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 විගණන හා කළමනාකරණ කමිටු

සභාව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

4.2 ප්‍රසම්පාදන සැලැස්ම

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා 2006 ජනවාරි 25 දිනැති අංක ජා.ප්‍ර.නි./ප්‍ර.වි.නි./18 දරන චක්‍රලේඛයේ 42(ආ) ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය